---

**හොරණ නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 13 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හොරණ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී ලැබී තිබූ රු. 226,990 ක් වූ වරිපනම් බදු සමාලෝචිත වර්ෂයේ වරිපනම් ආදායමට ගිණුම් ගත කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කර තිබූ නමුත් 2013 ජූලි 01 දින වන විටත් මිලදී ගෙන නොතිබූ යන්ත්‍ර වෙනුවෙන් රු.633,432 ක් ගෙවිය යුතු වියදම් සේ සලකා ගිණුම්ගත කර වත්කම් ප්‍රාග්ධනිත කරද තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වලින් අඩුකර තිබූ ඉකුත් වර්ෂවලට අදාල රු. 3,690,744 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල සමුච්චිත අරමුදල් ගිණුම හර කිරීම වෙනුවට ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ණයහිමි ගිණුමට හර කර තිබුණි. මේ සඳහා ඉකුත් වර්ෂවල ණයහිමි

ප්‍රතිපාදන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණ.

(ඇ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයගැතියන් සඳහා රු.990,132 ක් පමණක් ප්‍රතිපාදනය කර තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.12,140,936 ක් ලැබී එම මුදල කර්මාන්ත ණයගැති ගිණුමට (හිඟහිටි වෙනත් ආදායම් ගිණුමට) ගිණුම් ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමේ ශේෂය රු.11,150,804 කින් අඩුවෙන් දැක්විණ.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 51,612,310 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,730,375 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,109,922 ක් විය.

### 2.2 බැංකු ගිණුම්

(අ) නාගරික සංවර්ධන අධිකාරිය නමින් විවෘත කර තිබූ බැංකු ජංගම ගිණුම සහ මහජන බැංකු ජංගම ගිණුම 2006 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර, එදින සිට එම ගිණුම් දෙකේ පිළිවෙලින් රු.99,885 ක් සහ රු.941,985 ක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(ආ) 1973 දෙසැම්බර් 31 දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කොළඹ නගර ශාඛාවේ විවෘත කර තිබූ ඉතිරි කිරීමේ ගිණුමක් වූ අතර එය කුමන අරමුණක් සඳහා ආරම්භ කළේද යන්න පිළිබඳ පැහැදිලි කිරීම් හා තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවූ අතර එම ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට රු.734,331 ක ශේෂයක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 10,650 | 9,901 | 5,612 |
| (ii.) | බදු කුලී | 10,492 | 9,389 | 2,534 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 2,788 | 2,248 | -- |
| (iv.) | වෙනත් ආදායම් | 13,439 | 13,435 | 59,867 |

2:3:2 වරිපනම් බදු

2012 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟ ශේෂය රු.4,146,119 ක් වූ අතර ඉන් විගණිත දිනය වූ 2013 ජුනි 24 දින වන විට රු.911,942 ක් පමණක් අයකර ගෙන තිබීමෙන් තවදුරටත් රු.3,234,176 ක හිඟ ශේෂයක් විය.

2.3.3 ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු

2011 වර්ෂයට අදාල රු.28,200 ක් හා 2012 වර්ෂයට අදාල රු.80,520 ක් වශයෙන් ව්‍යාපාර ස්ථාන 58 කින් අයවිය යුතු ව්‍යාපාර බදු එකතුව රු.111,720 ක් ද, 2011 වර්ෂයට අදාල රු.6,000 ක හිඟ කර්මාන්ත බදු ශේෂයද විගණිත දිනය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 කඩකුලී

බදුකරුවන් 69 ක ගෙන් 1989 වර්ෂයේ සිට පැවත එන අයවිය යුතු රු.426,930 ක කඩකුලී ශේෂයක්ද, 2006 සිට 2012 දක්වා වර්ෂවලට අදාල රු.763,287 ක හිඟ කඩ කුලී ශේෂයක්ද 2013 මැයි 30 දින වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 වෙළඳසැල් කුලී

-----------------

වෙළඳසැල් 4 කට අදාල ගිවිසුම්වල වලංගු කාලය ඉක්මවා වර්ෂ ගණනාවක් ගත වී තිබූ නමුත් ඒවා අළුත් කිරීමට විගණිත දිනය වූ 2013 ජුනි 30 වන විටත් පියවර ගෙන නොතිබූ අතර එම පුද්ගලයින් විසින් අඛණ්ඩව වෙළඳසැල් පවත්වාගෙන ගොස් තිබුණි.

2.3.6 තානායම් ගාස්තු

------------------

2012 වර්ෂයට අදාල රු.940,800 ක් වූ හිඟ ආදායම අයකර ගැනීමට 2013 ජූනි 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

2.3.7 දැන්වීම් පුවරු ගාස්තු

----------------------

2012 වර්ෂයේදී සභාව විසින් සමීක්ෂණයක් සිදු කර හදුනාගෙන තිබූ දැන්වීම් පුවරුවලට අදාලව ආයතන 23 කින් අයවිය යුතු රු.125,500 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු විගණිත දිනය වූ 2013 ජූනි 30 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.8 උසාවි දඩ

--------------

1980 අංක 26 දරන ආහාර හා ඖෂධ විධිවිධාන පනතේ විධි විධානයන්ට අනුකුල නොවන ලෙස නගර සභා සීමාව තුළ ආහාර අලෙවිකරන ලද ස්ථානවලට එරෙහිව සභාව විසින් 2012 දෙසැම්බර් 19 දින දී සිදු කරන ලද වැටලීම් 07 කින් එම වෙළඳුන්ට එරෙහිව පවරන ලද නඩු වෙනුවෙන් අයකර තිබූ රු.69,000 කින් සභාවට ලැබිය යුතු මුදල් විගණිත දිනය වූ 2013 ජුනි 30 වන විටත් සභාවට ගෙන්වා ගෙන නොතිබුණි.

2.4 මෙහෙයුම් අකර්යක්ෂමතා

----------------------------

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකරගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා වූ සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සමඟ වර්ෂයෙ ඉටුකිරීමට

---

අපේක්ෂිත කාර්යයන් සඳහන් කර තිබූ නමුත් එක් එක් කාර්යයන්ගේ මූල්‍යමය වටිනාකම හා ඉටුකරනු ලබන කාලපරාසයන් ඇතුළත් කර නොතිබුණි. වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

2.5 අයවැය ලේඛනමය පාලනය

------------------------------

ආදායම් විෂයයන් 3 ක හා එක් වියදම් විෂයයක සියයට 12 සිට සියයට 39 දක්වා පරාසයක් තුළ වාසිදායක විචලනයක් අනාවරණය වූ අතර ආදායම් විෂයයන් 2 ක හා වියදම් විෂයයන් 4 ක සියයට 10 සිට සියයට 64 දක්වා පරාසයක් තුළ අවාසිදායක විචලනයක් අනාවරණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

2.6 අභ්‍යන්තර විගණනය

----------------------

මුදල් රෙගුලාසි 128, 132, 134 සහ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක WP/LGD/10/2008 සහ 2008 අගෝස්තු 19 දිනැති චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි පවත්වාගෙන යා යුතු අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැයකරණය